# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 ඔක්තෝබර් මස 22 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.10.25 දින නිකුත් කරන ලදී)**


# ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**ශෛලී අධ්‍යාපනික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශෛලී අධ්‍යාපනික පදනම
## (සංස්ථාගත කිරීමේ)

## ශෛලී අධ්‍යාපනික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"ශෛලී අධ්‍යාපනික පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් ඒ පදනමේ පරමාර්ථ සහ ඒ පදනමට සම්බන්ධ සියලු කාරණා ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ගෙන තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ සහ කාරණා පෙරදැරි කොට ගෙන ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් ඒ පදනම විසින් සාර්ථක ලෙස ඉටු කොට සහ ක්‍රියාත්මක කොට ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කිරීමට ඉල්ලුම් කොට ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

දරුවන් සහ තරුණ තැනැත්තන් ඓතිහාසික, සංස්කෘතික උරුමයේ අනන්‍යතාව ප්‍රදර්ශනය කිරීමට හැකියාව සහිතව මානසිකව හා ශාරීරිකව සෞඛ්‍යසම්පන්න කරවීමටත්, නිර්මාණශීලී හා කාර්ය සාධන ක්‍රියාකාරකම් හරහා ප්‍රජාව තුළ උසස් සෞන්දර්යාත්මක අධ්‍යාපනය වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලබන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක    දරන ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශෛලී අධ්‍යාපනික පදනම සංස්ථාගත කිරීම

2. (මෙහි මින්මතු "පදනම" යනුවෙන් හඳුන්වනු ලබන) ශෛලී අධ්‍යාපනික පදනමේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු "ශෛලී අධ්‍යාපනික පදනම" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට

පත්වන්නේ ය. තව ද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3.** (1) සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අධ්‍යාපනික නිර්මාණශීලී ක්‍රියාකාරකම්, වෘත්තීය ක්‍රියාකාරකම් සහ කාර්යසාධන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය, අනුග්‍රාහකත්වය සහ සම්බන්ධීකරණය හරහා ශ්‍රී ලංකාවේ වෙසෙන දරුවන්ගේ, වැඩිහිටියන්ගේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ (ශ්‍රවණාබාධිත, දෘෂ්‍යාබාධිත, මානසික හා ශාරීරිකව දුර්වල තැනැත්තන්ගේ) දැනුම වර්ධනය කිරීම පිණිස නව මාර්ග ඇති කිරීම සහ ඔවුන්ගේ පෞර්ෂය ගොඩනැඟීමට උපකාර වීම;

(ආ) දරුවන්ගේ, තරුණ තැනැත්තන්ගේ, වැඩිහිටියන්ගේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ඔවුන්ගේ ශාරීරික සහ මානසික තත්ත්වයන් සංවර්ධනය සඳහා යෝග්‍ය පසුබිමක් නිර්මාණය කිරීම;

(ඇ) තමන්ගේ සංස්කෘතික උරුමය හා අනන්‍යතාව පිළිබඳ තෘප්තිමත් හා ඒවා පිළිබඳ දැනුම ඇති සමබර පුද්ගලයන් වීම පිණිස දරුවන්, තරුණයින් සහ ජනකොට්ඨාස පුහුණු කිරීම;

(ඈ) ශ්‍රී ලංකාව තුළ විවිධ ජනවාර්ගික කොට්ඨාස අතර සාමය ඇති කිරීම සහ අදහස්, දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම පිණිස පහසුකම් සැලසීමේ පරමාර්ථය ඇතුළු සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් ආයතන සමග එක්ව සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඉ) විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ, වෘත්තීය පුහුණුව, වැඩමුළු පැවැත්වීම පිණිස සහ නිර්මාණශීලී හා වෘත්තීය කාර්යසාධන නිපුණතා වැඩිදියුණු කිරීම පිණිස අධ්‍යයන

කටයුතු සඳහා වූ ජාතික මධ්‍යස්ථානයක් විවෘත කිරීම සහ ඒ සම්බන්ධයෙන් තනිවම හෝ දේශීය හෝ (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කළ) ජාත්‍යන්තර ආයතන සමග එක්ව සහතික, ඩිප්ලෝමා සහ උපාධි ත්‍යාග පිරිනැමීම;

(ඊ) දරුවන්ගේ, තරුණ තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන ජනප්‍රවාද පිළිබඳව දැනුම්වත් කිරීම සහ දේශීය හා විදේශීය දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම; සහ

(උ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමෙහි ලා හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය සියලු කටයුතු හා දේ කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමටත් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වන නිලධාරින් සහ සේවකයන් පත් කිරීමට, සේවයේ යෙදවීම, සහ සේවයෙන් නෙරපීමට බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීති අනුව තෝරා ගනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් එකී සංස්ථාවේ රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය. කළමනාකරණ මණ්ඩලයේ ධුර කාලය වසර දෙකකි.

(2) මෙම පදනමේ ආරම්භකයා වන නැසීගිය විමලසිරි ද මෙල් මහතාගේ පවුලේ සාමාජිකයන් තිදෙනෙක්, පස්දෙනකුගෙන් සමන්විත ඉහත කළමනාකරණ කමිටුවට ඇතුළත් විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී පදනමේ ධුර දරන සාමාජිකයන් පළමු කළමනාකරණ කමිටුවට ඇතුළත් විය යුතු ය. එම කළමනාකරණ කමිටුවට පත් කරනු ලැබූ හෝ තෝරා ගනු ලැබූ සාමාජිකයෙක් තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව ධුර දැරිය යුතු ය.

සංස්ථා සාමාජිකත්වය

**6.** (1) සංස්ථාවේ සාමාජිකත්වය සාමාන්‍ය සාමාජිකයන් සහ ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(2) කෙසේ වුව ද සාමාන්‍ය සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන කිසියම් ප්‍රතිලාභ හිමිවන ආශ්‍රිත සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගැනීමට සුදුසුකම් නොලබන තැනැත්තන් සාමූහික සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලැබේ.

(3) ආශ්‍රිත සාමාජිකයන් සඳහා වෙනත් රෙජිස්ටරයක් පවත්වා ගෙන යා යුතු වන අතර, එසේ වුව ද ඔවුන් සංස්ථාවේ රැස්වීම්වල දී ඡන්දය දැමීමට සුදුසුකම් නොලබන අතර සාමාන්‍ය සාමාජිකයන් ලෙස ඇතැම් ප්‍රතිලාභ භුක්ති විඳිනු ඇත.

සංස්ථාවේ රීති

**7.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන් මහ සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින්, සංස්ථාවේ රැස්වීම් පැවැත්වීම්, එවැනි රැස්වීම්වල දී එහි කටයුතු කර ගෙනයාම, එහි වාර්ෂික වාර්තා සකස් කිරීම සහ එහි පරමාර්ථ ඉටු කරගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බලපැවැත්වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු වන අතර, (1) වන උපවගන්තිය යටතේ ඒ ආකාරයෙන් සාදනු ලැබූ එවැනි රීති වෙනස් කිරීම, සංශෝධනය හෝ පරිච්ඡින්න කළ හැකි ය.

(3) සංස්ථාව විසින් සාදනු ලබන රීතියක් (2) වන උපවගන්තිය යටතේ, යම් රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම, සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව

**8.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පහත දැක්වෙන දේ කිරීමට සංස්ථාවට නීතිමය බලය ඇත:-

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට හා දැරීමට;

(ආ) සංස්ථාවට අලෙවි කළ හෝ සංස්ථාව විසින් අත්කර ගත් හෝ දැරූ කිසියම් නිශ්චල දේපළක ගොඩනැගිල්ලක් ඉදිකිරීම;

(ඇ) එවැනි යම් දේපළක් විකිණීම, ප්‍රදානය කිරීම, උකස් කිරීම, බදුදීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම.

දායක මුදල් හා ගාස්තු අයකර ගැනීමට බලය

**9.** සංස්ථාවේ සාමාජිකයන් වෙනුවෙන් ලබාදුන් සේවාව වෙනුවෙන් එහි සාමාජිකයන්ගෙන් කිසියම් ප්‍රමාණයක ගාස්තුවක් හෝ දායක මුදලක් අයකර ගැනීම නීත්‍යානුකූල වේ.

සංස්ථාවේ ගිණුම්

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

**පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්**

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ අරමුදල**

**12.** සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු, හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම**

**13.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

**14.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**15.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධනපත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**16.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව